" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary

දුරකථන /தொலைபேசி/ Telephone - 011 - 2092599
ෆැක්ස් /பெக்ஸ்/ Fax - 011 - 2092601
ඊ-මේල් /மின்னஞ்சல்/ E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/01-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.02.08 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම</u>

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක **GOS/ADM/6/2/19** හා **2022.01.31** දිනැති ලිපි මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01 | රා.ප. චක්‍රලේඛ 18/2020 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම |
| 02 | රා.ප.චක්‍රලේඛ 03/2021 | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2020 අනුව පළාත් සංවර්ධන නිලධාරි සේවාවන් යටතේ පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලද නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව ඒකාබද්ධ සේවය යටතේ සංවර්ධන නිලධාරී සේවයේ තනතුරක් සඳහා ස්ථාන මාරු කිරීම |
| 03 | රා.ප. චක්‍රලේඛ 03/2016 (iv) | රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016 |
| 04 | රා.ප. චක්‍රලේඛ 02/2022 | රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම |
| 05 | රා.ප. චක්‍රලේඛ 22/2016 (i) | 2006.03.01 දින සිට 2007.07.01 දින දක්වා බඳවා ගත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා සහන සැලසීම |
| 06 | රා.ප. චක්‍රලේඛ 10/2015 (iv) | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම සමත් වීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්,ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන) ,
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2022

මගේ අංකය : Pns/P5/08/17
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2022.01.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම</u>**

ගරු මුදල් අමාත්‍යතුමන් විසින් 2022 මුදල් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය කථාවේ අංක 5.4.11 යටතේ රාජ්‍ය නිලධාරින්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දිර්ඝ කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලදී.

02. ඒ අනුව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට අවශ්‍ය සංශෝධන කිරීම සඳහා අංක:21/2270/315/040 හා 2021.12.30 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අනුමැතිය 2022.01.03 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ලබා දී ඇත.

03. විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා වන තීරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හෝ වෙනත් නීතියක් මඟින් හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස නිශ්චිතව තිරණය කර ඇති නිලධරයන් හැර අනෙකුත් සියලුම සිවිල් නිලධරයන් සඳහා අදාළ වේ.

04. 2022.01.01 දින සිට මෙම දීර්ඝ කිරීම ක්‍රියාත්මක වේ.

05. මේ වන විට විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගෙන ඇති සහ විශ්‍රාම යෑම සඳහා අනුමැතිය ලබා ගෙන ඇති අය සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

i. 2022.01.01 දින හෝ ඊට පසු දිනක විශ්‍රාම ගැනීමේ අභිලාශයෙන් කිසියම් නිලධාරියෙකු විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගෙන තිබේ නම් සහ ඔහු මෙම චක්‍රලේඛය ප්‍රකාරව තවදුරටත් සේවය කිරීමට අපේක්ෂා කරනු ලබයි නම්, ඔහු විසින් එසේ ලබා ගෙන ඇති විශ්‍රාම පූර්ව කාලයට අදාළ දින ගණන අදාළ පුද්ගලයා ඉදිරියේ දී විශ්‍රාම ගන්නා අවස්ථාවේ ගන්නා විශ්‍රාම පූර්ව නිවාඩු වලින් අඩු කර ගැනීම සිදු කළ යුතු අතර, ඒ සඳහා මනාපය අදාළ නිලධාරියා විසින් ලිඛිතව ලබා දීමෙන් අනතුරුව ඔහුගේ විශ්‍රාම ගැන්වීමේ ඉල්ලීම අවලංගු කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කළ යුතුය. අනතුරුව ඔහුට සේවයට වාර්තා කළ හැකිය. මෙම අවලංගු කිරීම පිළිබඳව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා ලිඛිතව දැනුම්වත් කළ යුතුය.

ii. එසේම 2022.01.01 දින සිට ඉදිරි කාලයක විශ්‍රාම ලබා ගැනීමට අයදුම් කළ / දැනටමත් විශ්‍රාම ගැන්වීම අනුමත කළ නිලධාරීන්ට ද ඔවුන්ගේ කැමැත්ත මත තවදුරටත් ඉහත වයස් සීමාව දක්වා සේවය කළ හැකිය. එවැනි අවස්ථාවල දී එම නිලධාරීන් තමා විසින් විශ්‍රාම ගන්වන ලෙස කළ ඉල්ලීම අවලංගු කරන ලෙස ලිඛිත ඉල්ලීමක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එවැනි අවස්ථාවක දී ඒ සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාට අවසර ලබාදිය හැකි අතර, අප්‍රමාදව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුම්වත් කළ යුතුය.

06. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ “ට” උපලේඛනය යටතේ විශ්‍රාම වැටුප් හිමිකම ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම ලැබීමට අවශ්‍ය අවම සේවා කාලය වසර 5 සිට වසර 10 දක්වා දීර්ඝ කෙරේ.

07. මෙයට පෙර විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ වල සඳහන් අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව හැර අනෙකුත් විධිවිධාන ඒ අයුරින්ම තවදුරටත් බලපවත්වනු ලැබේ.

08. මෙම චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ඇතිව නිකුත් කරන අතර, මෙම නියමයන්ට අනුව රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීමට අදාළව විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරනු ලබන ගැසට් නිවේදනය ඉදිරියේ දී නිකුත් කරනු ලැබේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් :

| | | |
|---|---|---|
| 01. සියලුම ගරු ආණ්ඩුකාරවරුන් | - | කරු. දැ.ගැ.ස. |
| 02. ජනාධිපති ලේකම් | - | කරු. දැ.ගැ.ස. |
| 03. අග්‍රාමාත්‍ය ලේකම් | - | කරු. දැ.ගැ.ස. |
| 04. අමාත්‍ය මණ්ඩල ලේකම් | - | කරු. දැ.ගැ.ස. |